# බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව

**දිනය** : 2013.07.26

**වේලාව** : පෙ.ව. 10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති හා වැඩබලන ගරු සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:**

| | | |
|---|---|---|
| 1. | ගරු උප සභාපති හා වැඩබලන ගරු සභාපති | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | අසංක නිල්මිණි විජයසිංහ මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | චමික ජයමිණ වැවේගෙදර මැතිතුමා |
| 8. | ගරු නාගරික මනත්‍රී | එම්. ජේ. මලික්ෂා මැතිතුමා |

ගරු සභාපති ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් පෞද්ගලික සංචාරයක් සඳහා විදේශගතව සිටින බැවින් මෙදින මහා සභා රැස්වීමට සහභාගී නොවීය.

**නිලධාරී සහභාගීත්වය**

1. ලේකම් එම්. එච්. සීලවතී මිය

## 01 ආගම සිහි කිරීම:

රැස්වීමට පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

## 02. පසුගිය සභා වාර්තාව සම්මත කිරීම

ගරු වැඩබලන සභාපතිතුමන් විසින් පසුගිය සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කරන ලද අතර, ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එය කියැවූ ලෙස සලකා සංශෝධනයන්ට යටත්ව එම වාර්තාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 03. ගරු වැඩබලන සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන

මෙදින මහා සභා රැස්වීමට පැමිණ සිටි ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා, ලේකම්තුමිය ඇතුළු සියළුම දෙනා ඉතාමත් සාදරයෙන් පිළිගන්නා බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දන්වන ලදී.

තමන් නගර සභාවේ මහා සභා රැස්වීමක මූලාසනය දරන පළමු අවස්ථාව බැවින්, මෙය තමන්ගේ ජීවිතයේ විශේෂ සංධිස්ථානයක බවත් එතුමන් සඳහන් කරන ලදී. තමන් තුඹගොඩ කොට්ඨාසයේ නාගරික මන්ත්‍රීවරයා වශයෙන් සිව්වතාවක් ජනතා කැමැත්තෙන් තේරී පත් වූ බවත්, සිව් වන අවස්ථාවේ දී මෙම සභාවේ උප සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට හැකි වූ බවත් එතුමන් ප්‍රකාශ කරන ලදී. පෙර පාසැල් අවධියේ සිට උසස් පෙල විභාගය කරන තෙක් පාසැලේ දි සියළුම අවස්ථාවන්ට සම්බන්ධ වෙමින් ක්‍රියාකාරීව කටයුතු කළ බවත්, එතැන් සිට මේ දක්වා නොයෙකුත් ආකාරයේ අත්දැකීම් තම ජීවිතය තුළින් ලබාගෙන කටයුතු කළ බවත් එතුමන් විසින් වැඩිදුරටත් සඳහන් කරන ලදී. එම ගමන් මගේ එක් අවස්ථාවක් වශයෙන් මෙවර මාස 03ක කාලයක් සඳහා

නගර සභාවේ සභාපති ධූරයේ කටයුතු ආවරණය කිරීමට අවස්ථාක් ලැබුණු බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

සබරගමුව පළාත්, පලාත් පාලන ආයතන අතර කාර්ය සාධන තරගයේ විනිශ්චය කටයුතු සඳහා ඉදිරි දින කිහිපය තුළ පැමිණීමට නියමිත බවත්, එම තරගයෙන් පෙර වතාවන්හි මෙන්ම ජයග්‍රහණය කිරීම සඳහා සියළුම දෙනාගේ සහයෝගය අපේක්ෂා කරන බවත් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් සඳහන් කරන ලදී. නගරය වඩාත් විධිමත් හා දර්ශනීය ස්ථානයක් බවට පත් කිරීම සඳහා පදික වේදිකා සහ විදුලි ලාම්පු මනාව පවත්වාගෙන යාම සහ ඒවායේ පවිත්‍රතාවය පවත්වාගෙන යාම අවශ්‍යතාවයක් බව ද එතුමන් විසින් සඳහන් කරන ලදී.

## 04. පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කිරීම

පසුගිය මහා සභා වාර්තාව සමාලෝචනය කරන ලදී. අතර පහත පරිදි සංශෝධන ඉදිරිපත් කරන ලදී.

### 04:01 ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමා

ගරු සභාපතිතුමන් පසුගියවර මහා සභාවේ දී දැනුම් දුන් පරිදි විදේශ සංචාරයට සහභාගී නොවන ගරු මන්ත්‍රීතුමන්ලා සඳහා රු. 50,000.00ක සහා ප්‍රතිපාදන මුදල් ලබා දීම සංශෝධනයක් වශයෙන් ඇතුලත් විය යුතු බව ගරු නාගරික මන්ත්‍රී චමික ජයමිණි වැවේගෙදර මැතිතුමන් විසින් සඳහන් කරන ලදී.

එමෙන්ම පසුගිය මහා සභාවේ දී කාරක සභා අවස්ථාවේ සාකච්ඡාවට ලක් කරන ලද ජේ. එෆ් ආයතනයේ නිවසට අදාල දඩ මුදල් අය කිරීම සම්බන්ධව සටහන්ව නොමැති බවත්, එය ද වාර්තාවට සංශෝධනයක් වශයෙන් ඇතුලත් කළ යුතු බවත් සඳහන් කරන ලදී.

### 04:01 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා

පසුගිය මහා සභා රැස්වීමේ දී තමන් විසින් සඳහන් කරන ලද ඉදිවෙමින් පවතින බලන්ගොඩ ළමා උද්‍යානය වටා අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සම්බන්ධව පසුගිය සභා වාර්තාවට ඇතුලත් වී නොමැති බැවින් එය මෙවර සභා රැස්වීමේ දී සංශෝධනයක් වශයෙන් ඇතුලත් විය යුතු බව සඳහන් කරන ලදී.

## 05. පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම

පසුගිය සභාවේ දී ගනු ලැබූ තීරණයන්හි ප්‍රගතිය හා කර්මාන්ත ප්‍රගතිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එය මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. සභාවට ලැබී ඇති ලිපි/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම

### 06:01 වරිපනම් නිදහස් කිරීම - අංක 15/1/1, කේ. ඇම්. ඩබ්. පලන්සූරිය මයා

වරිපනම් අංක 15 1/1 දරන ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලැබූ රක්ෂණ සමාගමේ බදු කාලය අවසන් වී වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඇති බැවින් එම ගොඩනැගිල්ලට අදාල වරිපනම් බදු ගෙවීමට අසීරු බැවින් අදාල වරිපනම් නිදහස් කර දෙන මෙන් කේ. ඇම්. ඩබ්. පලන්සූරිය යන අය විසින් මෙම සභාවෙන් ඉල්ලා ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, දෙවන කාර්තුවේ සිට අදාල වරිපනම් බදු මුදලින් 50%ක් නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:02 වරිපනම් සංශෝධනය කිරිම - අංක 125, ඇම්. ඒ. එස්. ඒ. විජයසිරි මයා**

බලන්ගොඩ, කල්තොට පාර, අංක 68 දරන ගොඩනැගිල්ල පිහිටි ඉඩම වාහන නවතා තැබීමේ ගරාජයක් වශයෙන් භාවිත කරන බැවින් අදාල වරිපනම් ගාස්තුව සංශෝධනය කරදෙන මෙන් මෙම සභාවෙන් ඉල්ලා ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම්දුන් අතර, එම ස්ථානය සඳහා 50%කින් වරිපනම් ගාස්තු අඩු කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් ඒකමතිකව සම්මත විය.

**06:03 මහජන පොල අංක 19 කඩ කාමරය මාසික කුලී පදනම මත ලබා ගැනීම - කේ. වී. සී. සී. ගුණරත්න මයා**

බලන්ගොඩ මහජන පොල අංක 19 දරන කඩ කාමරය තමන් වෙත ලබා දෙන මෙන් බලන්ගොඩ, වෙලන්හින්න, 297/බී යන ස්ථානයේ පදිංචි කේ. වී. චානක චමින්ද ගුණරත්න යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් සභාවට දැනුම් දුන් අතර, ගෙවීමට ඇති හිඟ කඩ කුලී ඇතුළු සියළු ගෙවීම් සිදු කළ පසු අදාල කඩකාමරය ඉල්ලීම කර ඇති අය වෙත ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 අංක 14 කඩකාමරය පවරා දීම - බී. එස්. උපමාලිකා මිය**

අංක 14 දරන කඩකාමරය තමන් හට පවත්වාගෙන යාම අපහසු බැවින් එය, හුණුකුඹුර, ගාලවත්ත යන ස්ථානයේ පදිංචි කේ. රේණුකා දමයන්ති අය වෙත පවරා දෙන මෙන්, රාස්සගල පාර, 63/1 යන ස්ථානයේ පදිංචි බී. එස්. උපමාලිකා යන අය විසින් ඉල්ලා ඇති බව ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමෙන් පසු අදාල අය වෙත එම කඩකාමරය ලබා දීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:05 වරිපනම් නිදහස් කිරීම - හපුතල පාර, අංක 22, එම්. එම්. පර්සානා මිය**

හපුතල පාර, අංක 22 ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල මෙම වර්ෂයේ දී අළුත්වැඩියා කටයුතු සිදු කරන බැවින්, වරිපනම් ගාස්තුවෙන් නිදහස් කර දෙන මෙන් එම්. එම්. පර්සානා යන අය විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දුන් අතර, මෙම වසරේ තුන්වන කාර්තුවේ සිට වරිපනම් මුදල 50%කින් අඩු කිරීමට මහා සභාව තීරණය කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:06 කාණු පද්ධතිය ඉදිකිරීම සම්බන්ධ බේරුම්කරණයේ අභියාචන ගොනු කිරීම සඳහා වෘත්තීයමය ගාස්තු ගෙවීම්**

බලන්ගොඩ වැසිජල කාණු පද්ධතිය ඉදිකිරීමට සම්බන්ධ ණය මුදල ගෙවීමට අදාල වානිජ මහාධිකරණ නඩු අංක CHC/ARB/58/2013 දරන නඩුවට අදාල අදාල වෘත්තීමය ගාස්තු වශයෙන් නීතිඥ සී. දයාරත්න මහත්මිය විසින් ලිපියක් මගින් ඉල්ලා ඇති රු. 7,500.00ක මුදල ගෙවීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**16:07 කෝපිවත්ත මාර්ගය ගල් අතුරා තාර යොදා නඩත්තු කිරීම**

පළාත් සභා ආධාර යටතේ කොපිවත්ත මාර්ගය ගල් අතුරා සංවර්ධනය කිරීම සඳහා රු. 1,460,615.41ක මුදලක් වෙන් කර ඇති බව ද, 2013.07.04 පැවති කර්මාන්ත කාරක සභා රැස්වීමේ දී මෙම කර්මාන්තය සඳහා සීමිත ටෙන්ඩර් කැඳවීමට තීරණය කරන ලද බව ද ගරු උප සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දුන් අතර, පළාත් මාර්ග අමාත්‍යංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට යටත්ව ඒ අනුව ටෙන්ඩර් කැඳවීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:08 මගනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන - 2013**

රත්නපුර දිස්ත්‍රික්කයේ මගනැගුම මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ මෙම නගර සභා බල ප්‍රදේශයට අයත් මාර්ගවල අන්තර් සම්බන්ධිත කොන්ක්‍රීට් කුට්ටි ඇතිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති බව දන්වා අධ්‍යක්ෂ (මගනැගුම) විසින් දන්වා එවා ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දැනුම් දෙන ලදී.

ඒ සමඟ එවා ඇති පහත මාර්ග ලැයිස්තුවට අදාල මාර්ග උක්ත ව්‍යාපෘතිය මගින් සංවර්ධනය කිරීමට වැඩබලන ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

| අනු අංකය | මාර්ගය | යෝජනාකරුගේ නම | වෙන් කර ඇති ප්‍රතිපාදන රු. |
|---|---|---|---|
| MPS/24/13/152 | බෝම්බුව, පරගහකුඹුර අතුරු මාර්ගය (චන්ද්‍රපාල මහතාගේ නිවස ඉදිරියෙන්) | ගරු සභාපති, ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා | 500,000.00 |
| MPS/24/13/153 | කරව්කැටිය අතුරු මාර්ගය (සිසිර මහතාගේ නිවස ඉදිරියෙන්) | | 500,000.00 |
| MPS/24/13/154 | අනඳමෙත්ගම ශෛලතලාරාම මාර්ගයේ දෙවන පටුමග | ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා | 500,000.00 |
| MPS/24/13/155 | මුගුණමලේ බංඩාරවත්ත මාර්ගය | | 500,000.00 |
| MPS/24/13/156 | ඇල්ලඅරාව නාමල් උයන මාර්ගය | ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා | 500,000.00 |
| MPS/24/13/157 | ඇල්ලඅරාව බෝධියට යන මාර්ගය | | 500,000.00 |
| MPS/24/13/158 | බලගහමුල සේනක පෙදෙසට යන පාර | ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා | 500,000.00 |
| MPS/24/13/159 | බාන්ස් රත්වත්ත මාවතේ රත්නායක සර්ලගේ නිවසට යන පාර | | 500,000.00 |
| MPS/24/13/160 | ගොරොක්ගහමඩ දෙවන පටුමග | ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා | 500,000.00 |
| MPS/24/13/161 | දෙහිගස්තලාව දෙවන පටුමග (අරුණ මහතාගේ නිවස අසලින් යන මාර්ගය) | | 500,000.00 |

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:09 පූර්ව මිශ්‍රණය සකස් කිරීම**

මාර්ග නඩත්තුව සඳහා අවශ්‍ය පූර්ව මිශ්‍රණය වෙනුවෙන් ලීටර 180 තාර බැරල් 20ක් සහ ලීටර් 200 කෝලාස් සී එස් එස් 02ක් ලබා ගැනීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:10 බස් වර්ජනය හේතුවෙන් රාජකාරියෙන් බැහැරව සිටීම**

2013.07.12 වන දින බලන්ගොඩ පෞද්ගලික බස්රථ වර්ජනය හේතුවෙන් රාජකාරියෙන් බැහැරව සිටි බැවින් නැවතුම්ගාස්තු එක් දිනක් සඳහා නිදහස් කරන මෙන් පෞද්ගලික බස්රථ බදුඅයකරු විසින් ඉල්ලා ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් දන්වන ලද අතර අදාල ගාස්තුව එක් දිනක් සඳහා නිදහස් කිරීමට යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 07. රු. 10,000.00ට වැඩි මුදල් ගෙවීම් අනුමත කිරීම

මුදල් කමිටුවේ සම්මත කරන ලදී.

## 08. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

ඇස්තමේන්තු ඉදිරිපත් කර නොතිබුණි

## 09. ලංසු මිල ගණන් සලකා බැලීම

ලංසු මිල ගණන් ඉදිරිපත් කර නොතිබුණි

## 10. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නඃ

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න ඉදිරිපත් කර නොතිබුණි.

## 11. යෝජනා

**11:01 ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු වැඩබලන සභාපතිතුමන් විසින් පහත යෝජනාව මහා සභාවේ අනුමැතිය පිණිස ඉදිරිපත් කරන ලදී.

11:01:01 බලන්ගොඩ නගර සභා සීමාවේ පවතින, එහෙත් බලන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ඡන්ද අයිතිය ඇති ඡන්ද දායකයන්ගේ ඡන්ද අයිතිය බලන්ගොඩ නගර සභාවට වන පරිදි නිවැරදි කර ගැනීම.

ඉහත යෝජනාවන් ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලද අතර, මේ සම්බන්ධව මැතිවරණ කොමසාරිස් වෙත දන්වා යැවීමට තීරණය මහා සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**11:02 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින ඉදිරිපත් කරන ලද පහත යෝජනාවන් ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

11:02:01 විශ්ව විද්‍යාල ශිෂ්‍යත්ව ලබා දීම

11:02:02 වැසිකිළි ආධාර ලබා දීම

11:02:03 නිවාස ආධාර ලබා දීම

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් එම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:03 ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමා**

පසුගිය දිනවල පැවති අධික වර්ෂා තත්ත්වය හේතුවෙන් පුරණගෙදර මාර්ගය අබලන් වී ඇති බැවින් එම මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීමට ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් කරන ලද ඉල්ලීම සඳහා මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. නිමල් කරුණාරත්න මැතිතුමන් විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් අදාල මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**11:04 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

11:04:01 පැරණි මහජන පොල අසල ඇති කඩකාමර කඩා ඉවත් කර එම ස්ථානය වාහන නැවතුමක් වශයෙන් සංවර්ධනය කිරීම

පැරණි මහජන පොල අසල ඇති කඩකාමර ලබා දී ඇත්තේ සංවර්ධනය පිණිස නැවත අත්කර ගැනීමේ කොන්දේසිය මත වන බැවින්, ඒවා අදාල ගිවිසුම්ප්‍රකාරව කඩා ඉවත් කර වාහන නැවතුම්පොලක් වශයෙන් එම ස්ථානය සංවර්ධනය කර එයින් සභාවට ආදායම් ලබා ගැනීමට ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ඉල්ලීමක් කර ඇති බව ගරු වැඩබලන සභාපතිතුමන් විසින් මහා සභාවට දැනුම් දෙන ලද අතර ඒ සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට එතුමන් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 12. ආදායම් වියදම් හා වෙනත් වාර්තා ඉදිරිපත් කිරීම

**12:01 2013 ජුනි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය**

- 2013 ජුනි මාසය සඳහා වන ලැබීම් විග්‍රහය ගරු සභාපතිතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 3,700,624.16 |
| වෙනත් ලැබීම් | 1,682,957.38 |
| **මුළු ලැබීම්** | **5,383,581.54** |
| පුනරාවර්තන වියදම් | 2,818,403.64 |
| වෙනත් වියදම් | 1,368,776.43 |
| **මුළු වියදම්** | **4,187,180.07** |

- බලන්ගොඩ තානායමේ 2013.06.30 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිණුම ද එතුමන් විසින් මහා සභාවට ඉදිරිපත් කරන ලදී.

ඉහත වාර්තාවන් සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

**12:02 2013.06.01 සිට 2013.06.30 දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවන්**

2013.06.01 සිට 2013.06.30 වන දින දක්වා වාහන සඳහා ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදී. අදාල කාලසීමාවට අදාල මුළු ඉන්ධන වියදම රු. 447,236.85 කි.

ඉහත ඉන්ධන වියදම් වාර්තාවට මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර විරුද්ධව අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 13. කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම

### 13:01 පුස්තකාල උපදේශන කාරක සභාව

2013.07.03 වන දිනැති මෙම සභාවේ පුස්තකාල උපදේශන කාරක සභා වාර්තාවට අනුමැතිය ලබා දීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූ හෙයින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:02 කර්මාන්ත කාරක සභාව

2013.07.04 වන දින පැවති මෙම සභාවේ කර්මාන්ත කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර, වෙනත් අදහස් ඉදිරිපත් නොවූ බැවින් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

### 13:03 මුදල් කාරක සභාව

2013.07.16 වන දින පැවති මෙම සභාවේ මුදල් කාරක සභා වාර්තාව සඳහා මහා සභාවේ අනුමැතිය ලබා දීමට ගරු වැඩබලන සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් විසින් ස්ථිර කරන ලද අතර වෙනත් අදහස් ඉදිරිපත් නොවූයෙන් මහා සභාවේ ඒකමතිකව සම්මත විය.

## 14. වෙනත් කරුණු:

### 14:01 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා:

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමන් මහා සභාව අමතමින් කිරිඳිගල මැද පාර සහ ඉත්තෑගල පාර යන මාර්ගයන් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයට පැමිණ ඇති බව සඳහන් කරන ලදී.

බළන්ගොඩ නගරය ඉතාමත් දැකුම්කළු නගරයක් වශයෙන් කලක් තිස්සේ පැවති බවත් දැන් නැවතත් නගර සංවර්ධන සැලැස්මට පිටින් ඇතැම් කටයුතු සිදු වන බැවින් පිළිවෙලක් නොමැති මට්ටමට පැමිණ ඇති බවත්, මහජන පොල, බස්නැවතුම්පොල ආදිය නිසි පරිදි අලංකාරව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු බවත්, වැසිකිළි කැසිකිළි ආදිය අබලන් වීමට නොදී, පිරිසිදුව සහ සිත්ඇදගන්නා පරිදි පැවතිය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රීතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී. එමෙන්ම පසුගිය මහා සභාවාරයක දී ගන්නා ලද තීරණය අනුව බස්නැවතුම්පොලෙහි විශාල ප්‍රමාණයේ පිරිසැකැස්මක් ජනතාවට දර්ශනය වන අයුරින් තැබීම කඩිනමින් සිදු කළ යුතු බවට ද එතුමන් ප්‍රකාශ කරන ලදී. එමෙන්ම ජනතාවට පානීය ජලය ලබා ගැනීමට පහසු වන අයුරින් ජලනල ස්ථාපිත කිරීම ද කාලීන අවශ්‍යතාවයක් බව එතුමන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අනවසර ඉදිකිරීම් සම්බන්ධව කටයුතු කිරීමේ දී සාමාන්‍ය ජනතාවට මෙන්ම රාජ්‍ය ආයතනයන් සඳහා ද සමානව සලකා බැලීම සිදු කළ යුතු බව ද, මේ වන විට එක්තරා රාජ්‍ය ආයතනයකින් නිසි පරිදි සැලසුම් අනුමත කර නොගනිමින් ඉදිකිරීම් කටයුත්තක් සිදු කරමින් පවතින බව ද ගරු නාගරික මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී.

මෙසේ විධිමත්ව නගරය පවත්වාගෙන යාමෙන් ඉදිරියේ දී හොඳම පළාත් පාලන ආයතනය තේරීමේ තරගයන් සඳහා සාර්ථකව මුහුණ දී ජයග්‍රහණ ලබා ගැනීමට හැකි වනු ඇති බවට ද ගරු නාගරික මන්ත්‍රීතුමන් විශ්වාසය පළ කරන ලදී.

*මේ සම්බන්ධව අදහස් දක්වමින් **ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන්** සඳහන් කළේ, ගරු නාගරික මන්ත්‍රීතුමන් විසින් සඳහන් කළ පරිදි, බළන්ගොඩ පොලිස් ස්ථානයට අදාලව ඉදිකිරීම් කටයුතු මේ දිනවල සිදු කරන බවත්, සියළුම දෙනා හට පළාත් පාලන ආයතනයක් වශයෙන් සමානව කටයුතු කළ යුතු බැවින් එම ඉදිකිරීම වලට අදාල සැලසුම් අනුමත කිරීම් සහිතව නොකිරීම සම්බන්ධව නීතිමය කටයුතු කිරීමට වැඩ අධිකාරී වෙත සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත උපදෙස් ලබා දෙන බවත්ය. මේ සම්බන්ධව ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යංශ ලේකම් වෙත සවිස්තරව දන්වා යැවීමට කටයුතු කරන බව ද එතුමන් වැඩිදුරටත් සඳහන් කරන ලදී.*

*වෙනත් දියුණු විදේශ රටවල්හි සිදුකරන ලද සංචාරයන්හි දී ඉතාමත් සැලසුම් සහගත නගර නිරීක්ෂණය කළ බවත්, බළන්ගොඩ නගරයේ ද ඒ ආකාරයට පවත්වාගෙන යනු ලැබීම අත්‍යවශ්‍ය බවත් සඳහන් කරන ලදී.*

**14:02 ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා**

පැරණි මහජන පොල භූමියේ ඉවත් කිරීමට යෝජිත කඩ පවත්වාගෙන යන්නන් සඳහා බස්නැවතුම්පොල ඉහළ මහලේ කඩ කාමර ලබා දීමට හැකි නම් ඉතා සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමන් මහා සභාව අමතමින් ප්‍රකාශ කරන ලදී.

එමෙන්ම වීථි ලාම්පු නඩත්තු කිරීමේ දී විදුලි කම්කරු සමග ප්‍රදේශයට අදාල ගරු මන්ත්‍රීතුමන් ද පැමිණ අදාල කාර්යය නිරීක්ෂණය කිරීමට මීට පෙර සභා වාරයේ දී ඉල්ලීමක් කරන ලද බව නැවත සිහිපත් කරන ලදී.

කලකට පෙර බළන්ගොඩ නගර සීමාව තුළ හොඳම මාර්ගය වශයෙන් තිබූ බෝම්බුව පාර මේ වන විට වලවල් සෑදී අබලන් තත්ත්වයට පත්ව ඇති බවත්, එම මාර්ගය නොසලකා හැරියහොත් නැවත අලුත්වැඩියා කිරීමට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කළ යුතු බැවින් දැන්ම ඒ සම්බන්ධව අවධානය යොමු කිරීමට මහා සභාවේ අවධානය යොමු විය යුතු බව ගරු නාගරික මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී.

**14:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ටී. එම්. රූමි මැතිතුමන් මහා සභාව අමතමින්, කල්තොට පාර කුමාරගම පංසල දක්වා මාර්ගයේ කොටසක් බළන්ගොඩ ප්‍රාදේශීය සභාවට අයත් වුවත්, එහි ජීවත් වන පවුල් 25ක් පමණ මෙම සභාවට සම්බන්ධ සේවාවන් ලබා ගන්නා බැවින්, එම කොටස ද මෙම සභා බලප්‍රදේශයට අයත් කරගෙන සංවර්ධනය විය යුතු බව සඳහන් කරන ලදී. එහි කොටසක් පළාත් මාර්ග ගරු අමාත්‍ය අතුලකුමාර රාහුබද්ධ මැතිතුමන්ගේ ප්‍රතිපාදනයන්ගෙන් සංවර්ධනය කර ඇති බව ද එතුමන් සඳහන් කරන ලදී.

එමෙන්ම මාර්ග සංවර්ධන කාර්යයන් වෙනුවෙන් මෙම සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරුන් එක් අයකුට සඳහා රු. 1,000,000.00 බැගින් වෙන් කිරීම සම්බන්ධව මහා මාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය නිර්මල කොතලාවල මැතිතුමන්ට ස්තුතිය පළ කරන බව ද ගරු මන්ත්‍රීතුමන් සඳහන් කරන ලදී.

එමෙන්ම රාමසාන් උපවාස කාලය තුළ ආගමික කටයුතු සඳහා වීථිලාම්පු සවිකර දෙන මෙන් ගරු සභාපතිතුමන් වෙතින් කරන ලද ඉල්ලීම ඉතාමත් මැනවින් ඉටුකිරීම සම්බන්ධව තම ස්තුතිය පළ කරන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් දිවයිනේ රැඳී නොසිටින කාලය තුළ අදාල රාජකාරී ආවරණය කරනු ලබන ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන්ට සභාවේ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය හිමි වන බව ද ගරු නාගරික මන්ත්‍රීතුමන් සඳහන්

කරන ලදී. ගරු සභාපතිතුමන් විසින් ගන්නා ලද ඕනෑම හොඳ තීරණයකට සහයෝගය දැක්වූ පරිද්දෙන්ම ගරු වැඩබලන සභාපතිතුමන් ගන්නා ඕනෑම හොඳ තීරණයකට තම සහයෝගය ලබා දෙන බව ද එතුමන් ප්‍රකාශ කරන ලදී.

## 15. අවසානය

**ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු වැඩබලන සභාපති ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමන් සභාව අමතමින්, මෙය තමන් සභාපති තනතුරේ රාජකාරි කටයුතු ආවරණය කරනු ලබන පළමු අවස්ථාව බැවින් සභා රැස්වීමට පැමිණෙන අවස්ථාවේ දී යම් චකිතයක් තිබූ නමුත්, සභාව පවත්වාගෙන යාමේ දී සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙතින් ලද සහයෝගය හේතුවෙන් කිසිදු වෙනසක් නොදැනී එම කටයුතු නිසි පරිදි කරගෙන යාමට හැකි වූ බව ද, ඉදිරියේ දී ද එම සහයෝගය ඒ අයුරින්ම බලාපොරොත්තු වන බව ද සඳහන් කරන ලදී.

ඉදිරියේ දී පැවැත්වෙන පළාත් පාලන තරගයට සාර්ථකව මුහුණ දීමට බලාපොරොත්තු වන බවත්, සභාවට ඉදිරිපත් කරන සියළු ලිපි න්‍යායපත්‍රයට ඇතුලත් වීම අනිවාර්ය බවත්, ඉතාමත් විශේෂ අවස්ථාවක දී පමණක් වෙනත් ලිපි ඉදිරිපත් කළ යුතු බවත් එතුමන් සඳහන් කරන ලදී.

2013 ජුලි මාසයට අදාල මහා සභා රැස්වීම ප. ව. 11.30ට පමණ අවසන් වූ අතර, පැමිණ සිටි සියළු දෙනාට ලබා දෙන ලද සහයෝගය සම්බන්ධයෙන් නැවතත් ස්තූතිය පළ කරමින් සහ සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් ගරු සභාපතිතුමන් විසින් රැස්වීම් වාරය අවසන් කරන ලදී.

ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න,
වැඩබලන සභාපති,
බලන්ගොඩ නගර සභාව.